| | |
|---|---|
| විෂය | - නාට්‍ය හා රංග කලාව |
| ශ්‍රේණිය | - 11 |
| කාලච්ඡේද | - 60 |

| | නිපුණතාවය Competency | ක්‍රියාකාරකම Activity | අත්‍යවශ්‍ය ඉගෙනුම් පල Essencial Learning Outcomes | විෂය අන්තර්ගතය Suject Content | කාලච්ඡේද Periods |
|---|---|---|---|---|---|
| 10 ශ්‍රේණියෙන් කාලච්ඡේද 24 | 1 නාට්‍ය හා රංග කලාවට පාදක සිද්ධාන්ත පැහැදිළි කරයි. | 1.4 වේදිකා නාට්‍යවල විශේෂ ලක්ෂණ හඳුනා ගැනීම. (සිද්ධාන්ත) | ▪ සජීවී කලාවක් ලෙස නාට්‍යයෙහි සුවිශේෂී බව ප්‍රකාශ කරයි.<br>▪ නාට්‍යයෙහි කතා වස්තුව මුල, මැද, අග සහිත සිදුවීම් මාලාවක් හෝ අවස්ථාවක් ඇතුළත් ව ඇතත් ඒවා අනුපිළිවෙළ සාහිත්‍යය, නාට්‍යයක සුවිශේෂී ලක්ෂණයක් බව ප්‍රකාශ කරයි.<br>▪ නාට්‍යය ප්‍රේක්ෂකයන් හමුවට ඉදිරිපත් කිරීම සඳහා සතර අභිනය භාවිත කරන ආකාරය විස්තර කරයි.<br>▪ නාට්‍යයක් සඳහා යොදා ගන්නා ආනුෂංගික ශිල්ප නම් කරයි.<br>▪ නාට්‍යය යනු සාමූහික ප්‍රයත්නයක යහපත් වූ ප්‍රතිඵලයක් බව ප්‍රකාශ කරයි. | ▪ නාට්‍ය පෙළ හෙවත් පිටපතක, කතා වස්තුව, පෙළ ගැස්ම, අවකාශ භාවිතය, ශෛලිය, අපූර්ව අත්දැකීම් ඇතුළත් ව ඇති බව<br>▪ සතර අභිනය භාවිතය<br>▪ ආනුෂංගික කලා ශිල්ප සුසංයෝගී වන ආකාරය<br>▪ නාට්‍යය සඳහා ප්‍රේක්ෂක සහභාගිත්වය හා සජීවී බවෙහි විශේෂතා<br>▪ ප්‍රේක්ෂක අවධානය ලබා ගැනීම සඳහා විශේෂ රංග ප්‍රයෝග, ප්‍රවේශන රටා, නිෂ්ක්‍රමණ රටා බලපාන ආකාරය | 02 |
| | | 1.5 රූපණ ශිල්පියා ගේ කාර්යභාරය හඳුනා ගනිම (සිද්ධාන්ත) | ▪ ''රූපණය'' යන්න හඳුනා ගනියි. ▪ ශිල්පීය කුශලතා වර්ධනය කර ගනියි. ▪ අනුකරණය සහ සමාරෝපය, රූපණය සඳහා උපයෝගි කර ගනියි. ▪ රූපණයේ දී සතර අභිනය භාවිතය විශේෂ වන ආකාරය නිරීක්ෂණය කරයි. ▪ රූපණ | ▪ රූපණය අර්ථ කථනය<br>▪ රූපණයේ දී අනුකරණය හා සමාරෝපය යන ක්‍රියාවලියේ වැදගත්කම.<br>▪ රූපණය පුහුණු වීමේ දී නළුවන් විසින් ප්‍රගුණ කළ යුතු අංශ.<br>▪ 1. අභ්‍යන්තරික ප්‍රකාශනය (සිත)<br>▪ 2. බාහිර ප්‍රකාශනය (ශරීරය හා කටහඬ) | 02 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | ශිල්පියෙකුට අවශ්‍ය ගුණාංග හඳුනාගනියි. | ▪ රූපණයේ දී පරිකල්පනය භාවිතය හා විශේෂ අවධානය යොමු කළයුතු කරුණු | |
| | | 1.6 රංග භූමි හඳුනා ගනිම (සිද්ධාන්ත) | ▪ රංග භූමිය හඳුනා ගනියි.<br>▪ රංග භූමියක තිබිය යුතු මූලික ලක්ෂණ වටහා ගනිමින් ප්‍රකාශ කරයි. | ▪ රංග භූමිය හඳුනා ගැනීම<br>▪ රංග භූමිය හඳුන්වන විවිධ නම්<br>▪ රංග භූමිවල විශේෂ ලක්ෂණ<br>▪ අතීතයේ රංග භූමිය ලෙස භාවිත කළ ස්ථාන | 01 |
| | | 1.7 රංග භූමි වර්ග හඳුනා ගනිම (සිද්ධාන්ත) | ▪ රංග භූමි වර්ග හඳුනා ගනියි. ▪ රංග භූමියේ නූතන මනඃකල්පිත බෙදීම් පෙන්වා දෙයි. | ▪ රංග භූමි වර්ග<br>▪ රංග භූමිවල විශේෂ ලක්ෂණ<br>▪ රංග භූමිවල විවිධ හැඩ විමසීම<br>▪ නූතන රංග භූමියේ මනඃකල්පිත ව බෙදා ඇති කොටස් හා බෙදීමෙන් ලැබෙන වාසි. | 01 |
| | 2. ස්වකීය පරිකල්පනය මෙහෙයවා පරිසරය ආශ්‍රිත අත්දැකීම් පාදක කොට ගෙන නිර්මාණකරණයෙහි යෙදෙයි. | 2.5 ක්ෂණික නිරූපණයේ යෙදීම (සිද්ධාන්ත හා ප්‍රායෝගික) | ▪ සිසුන් සාමූහික ව නිශ්චිත නිරූපණයන් හි යෙදෙයි.<br>සාමූහික ව සාකච්ඡා කර අවස්ථාවන් ගොඩනගා ගැනීමට හැකියාව ලබයි.<br>▪ ඒකල ව ක්ෂණික නිරූපණයන්හි යෙදෙයි. ▪ සාමූහික ව කටයුතු කරයි.<br>▪ රංගන කුසලතාව, පරිකල්පනය දියුණු කර ගනිය | ▪ ක්ෂණික නිරූපණ අර්ථකථනය<br>▪ ක්ෂණික නිරූපණ ක්‍රියාකාරකම් | 02 |
| | | 2.7.1 නාට්‍ය පෙළක් ලියමු. (සිද්ධාන්ත හා ප්‍රායෝගික) | ▪ ගුණාත්මක යෙදවුම්වල යොදා ගෙන ඇති චිත්‍ර / ලිපි / පුවත්පත් / ඡායාරූප ආදී අධ්‍යයනය කර නාට්‍යෝචිත අවස්ථා තෝරා ගනියි.<br>▪ පරිකල්පන ශක්තිය මෙහෙයවා නාට්‍ය නිර්මාණයෙහි යෙදෙයි.<br>▪ නාට්‍යෝචිත සංවාද ලියයි.<br>▪ පෙළ රචනයේ දී යටි පෙළින් මතු විය යුතු ජීවන දෘෂ්ටිය ගැන සැළකිළිමත් වෙයි. | ▪ කණ්ඩායම් සඳහා දී ඇති ගුණාත්මක යෙදවුමට අනුව / නාට්‍යෝචිත සිද්ධීන් තෝරා ගැනීම<br>▪ තෝරා ගන්නා ලද නාට්‍යෝචිත අවස්ථා සඳහා සංවාද ගොඩ නැගීම<br>▪ නාට්‍යෝචිත අවස්ථා ගොඩ නැගීමට අදාළ චරිත තෝරා ගැනීම<br>▪ රංග විධාන භාවිත කිරීම<br>▪ නාට්‍ය සාමූහික ක්‍රියාවලියක් බව අවබෝධ කර ගනිමින් නාට්‍ය පෙළ රචනය | 02 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | ■ පෙළට රංග විධාන ඇතුලත් කිරීමට උනන්දු වෙයි. | | |
| | | 2.7.2 නාට්‍යයක් රඟ දක්වමු. | නාට්‍ය පෙළ අවබෝධයෙන් යුතු ව කියවයි. ■ නිෂ්පාදනයට සුදුසු නාට්‍ය පිටපතක් තෝරා ගනියි.<br>■ නාට්‍ය පෙළ භූමිකා සඳහා නළු නිළියන් තෝරා ගනියි.<br>■ ආනුෂංගික ශිල්ප අංගයන් භාවිත කරයි.<br>නාටය පිටපත් සාමූහික ක්‍රියාවලියකින් රංගයන් බවට පත් කරයි. | ■ නිෂ්පාදනය සඳහා සුදුසු නාට්‍ය පිටපතක් තෝරා ගැනීම.<br>■ නාට්‍ය පිටපතට සුදුසු භූමිකා සඳහා නළුවරණයකින් නළුනිළ සාමූහික රංගනයක් බවට අවබෝධ කර ගැනීම.<br>■ සමස්ත රංග කාර්ය සංවිධානය කිරීම | 02 |
| | 3. නාට්‍ය හා රංග කලාවේ සිද්ධාන්ත අනුගමනය කරමින් ප්‍රායෝගික ක්‍රියාකාරකම්හි නියැලෙයි. | 3.4.1 මුහුණ රචනා කරමු | ■ අංග රචනය යනු කුමක්දැයි අදහස් පළ කරයි.<br>■ මුහුණේ කලාප හඳුනා ගෙන නම් කරයි<br>■ අංග රචනා ද්‍රව්‍ය නම් කරයි.<br>■ නිවැරදි ව අංග රචනයෙහි යෙදෙයි | ■ අංග රචනය යන්න හැඳින්වීම<br>■ මුහුණෙහි කලාප නම් කිරීම<br>■ අංග රචනා ද්‍රව්‍ය නම් කිරීම<br>■ අංග රචනා කිරීමේ සූදානම<br>■ අංග රචනය කාර්යයෙහි නියැළීම | 02 |
| | 4. නාට්‍ය හා රංග කලාවට සම්බන්ධ ශ්‍රී ලාංකේය සංස්කෘතියේ ඓතිහාසික පසුබිම පැහැදිලි කරයි. | 4.3.1 ː රංගන ශිල්පීන් හඳුනා ගනිම | ■ නම් කරන ලද රංගන ශිල්පීන් හඳුනාගත් බව පවසයි.<br>■ ඔවුන් රඟ පෑ විවිධ නාට්‍ය කෘති නම් කරයි.<br>■ ඔවුන්ගේ රංගන අවස්ථාවන් විමසා බලයි. | ■ මානෙල් ජයසේන, විජය නන්දසිරි, කෞශල්‍යා ප්‍රනාන්දු, ශ්‍රියන්ත මෙන්ඩිස්, ජැක්සන් ඇන්තනී, විජේරත්න වරකාගොඩ යන රංගන ශිල්පීන්ගේ,<br>රංගන අවස්ථා විමසා බැලීම.<br>නාට්‍ය කෘති නම් කිරීම.<br>ඔවුන් රංගනයේ නියුතු වූ වෙනත් කලා අංශ සොයා බැලීම. | 02 |
| | 5. නාට්‍යමය අවස්ථා සෞන්දර්යාත්මක ව විඳ ගැනීම හා | 5.1.1 කාලගෝල නාට්‍යයේ තේමාව හා වස්තුව හඳුනාගනිමු. | ■ දික්තල - කාලගෝල නාඩගමට පාදක වූ කතා වස්තුව හා තේමාව හඳුනා ගත් බව පවසයි. | ■ උම්මග්ග ජාතකයේ සඳහන් වන කාලගෝල ප්‍රශ්නය සහ දික්තල - කාලගෝල නාට්‍ය පෙළ කියවීමට සිසුන්ට අවස්ථාව ලබා දීම. | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | මානව හිතවාදියකු ලෙස සමාජගත වීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි. | | ■ මූල බීජය හා නාට්‍ය පෙළ අතර වෙනස වැටහෙන බව පවසයි.<br>■ නාඩගම් සම්ප්‍රදායයේ ලක්ෂණ හඳුනාගත් බව කියයි.<br>■ නාට්‍ය පෙළින් ඉස්මතු වන නාට්‍ය දෘෂ්ටිය හඳුනා ගත් බව පවසය | ■ කාලගෝල කතා වස්තුව<br>■ දික්තල-කාලගෝල නාට්‍ය පෙළ කියවීම<br>■ නාට්‍ය පෙළ හා මූලාශ්‍ර කතාව අතර සමාන අසමානතා.<br>■ කතා වස්තුවේ තේමාව දෘෂ්ටිය<br>■ නාට්‍යයේ දී එම තේමාවට එක් වන නව දෘෂ්ටිය | 08 |
| | | 5.1.2 ''කාලගෝල රස විඳිමු'' | ■ නාඩගම් සම්ප්‍රදාය හා නාට්‍ය ධර්මී ශෛලීන් හඳුනා ගනියි.<br>■ නාට්‍යයක සතර අභිනය යොදා ගන්නා අයුරු විමසයි.<br>■ පුද්ගල මනෝභාව පිරික්සයි.<br>■ නාට්‍යයේ ගැටුම් අවස්ථා විමසයි.<br>■ නාට්‍ය පෙළ මැනවින් හඳුනාගත් බව කියයි. | ■ නිර්දිෂ්ට පෙළෙහි දක්නට ලැබෙන නාඩගම් සම්ප්‍රදායට අයත් ලක්ෂණ, නාට්‍ය ධර්මී ශෛලිය, සංවාද, චරිත, අවස්ථා හා සිද්ධීන්, ගැටුම් අවස්ථා, තේමාව. සතර අභිනය භාවිත වන ආකාරය, අංග රචනය හා වෙස් ගැන්වීම්වල ස්වාභාවිකත්වය ඉක්මවා යන පරිකල්පනාත්මක බව විමසීම. | |
| | | 5.2.2 කාලගෝල නාටකය අගය කරයි. | ■ නාට්‍යයක් නරඹා එය අගය කරයි.<br>■ අගය කිරීමට පාදක වූ හේතු ප්‍රකාශ කරයි. ■ නාඩගම් සම්ප්‍රදායයට අයත් රංගෝපක්‍රම අගය කරමින් කතා කරයි.<br>■ ජීවිතය සාර්ථක කර ගැනීමට අවශ්‍ය අත්දැකීම් ලබා ගැනීමටත්, ප්‍රතික්ෂේප කළ යුතු දෑ වටහා ගැනීමටත්, ''දික්තල කාලගෝල'' නාට්‍යය ඇසුරෙන් අත්දැකීම් ලබයි. | ■ චරිත ලක්ෂණ හඳුනා ගැනීම<br>■ නාටකීය අවස්ථා පැහැදිලි කිරීම<br>■ නාටකීය ආකෘතිය විස්තර කිරීම<br>■ නාටකීය අන්තර්ගතය සාකච්ඡා කිරීම | |
| | | | | | |
| **11 ශ්‍රේණියෙන් කාලච්ඡේද 36** | 1. නාට්‍ය හා රංග කලාවට පාදක සිද්ධාන්ත පැහැදිලි කරයි. | 1. 1.1 ප්‍රාසංගික කලා හඳුනාගනිමු. | ■ ප්‍රාසංගික කලාව යන්න නිර්වචනය කරයි. ■ ප්‍රාසංගික කලාවට අයත් විෂය ක්ෂේත්‍ර හඳුනාගනියි.<br>■ ඒ ඒ කලාංගයට ආවේණික සුවිශේෂ ලක්ෂණ හඳුනාගෙන ලේඛනගත කරයි. | ■ සංගීත සංදර්ශනයක, නර්තන සංදර්ශනයක, මුද්‍රා නාට්‍යයක, ඔපෙරාවක, වේදිකා නාට්‍යයක ප්‍රාසංගික බව හඳුනාගැනීම. | 02 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | 1.1.2 සෙසු ප්‍රාසාංගික කලා අතුරෙන් නාට්‍ය කලාවෙහි සුවිශේෂී ලක්ෂණ හඳුනාගැනීම. | ▪ නාට්‍යයක අන්තර්ගත කලාංග පිළිබඳව විමසයි.<br>▪ විවිධ කලා මාධ්‍යයන්ගේ භාවිතය පිළිබඳ අවශ්‍යතාව තේරුම් ගනියි.<br>▪ විවිධ කලාවන් අතර නාට්‍යයට හිමි තැන අවබෝධ කරගනියි.<br>▪ සෘජු ප්‍රේක්ෂක ප්‍රතිචාර මත ක්ෂණික ව වෙනස්වීම් කළ හැකි බව වටහාගනිය | ▪ නාට්‍යයක ප්‍රාසංගික බව<br>▪ නාට්‍යයක ඇතුළත් විවිධ කලා මාධ්‍යයන්<br>▪ සජීවී බවෙහි ඇති සුවිශේෂත්වය<br>▪ නාට්‍යය වෙනත් කලා මාධ්‍යයන් සමග සැසැඳීම.<br>▪ නාට්‍යයක් ප්‍රදර්ශනය කිරීම සඳහා සහභාගී වන පිරිස | 01 |
| | | 1.2.1 වේදිකාවට ආලෝකය | ප්‍රොසීනියම් වේදිකාවක අඳුර පලවා හැරීමට උපක්‍රම යෝජනා කරයි.<br>▪ ආහාර්ය අභිනයේ විශේෂ අංගයක් වශයෙන් රංගාලෝකය වැදගත් වන බව පිළිගනියි.<br>▪ වේදිකා නාට්‍යයකට රංගාලෝකයේ අවශ්‍යතාව පැහැදිලි කරයි.<br>▪ නළු කාර්යය පහසු කිරීම පිණිස ''රංගාලෝකය'' සහාය කරගනියි. | ▪ රංගාලෝකය යන්න පැහැදිලි කිරීම.<br>▪ රංගාලෝකයේ ඇති වැදගත්කම<br>▪ රංගාලෝකයේ විකාශනය<br>▪ නාට්‍ය ඇතුලත් දෘශ්‍ය පටයේ ආලෝක භාවිතය හඳුනාගැනීම.<br>▪ ආදේශ උපකරණ භාවිතයෙන් ආලෝකය සපයාගැනීම.<br>▪ නාට්‍යය සජීවීකරණය කිරීම සඳහා රංගාලෝකයේ වැදගත්කම | 01 |
| | | 1.2.2 ආලෝක උපකරණ හා භාවිතය | ▪ රංගාලෝක උපකරණ හඳුනාගනියි.<br>▪ ඒ ඒ උපකරණවල කාර්යභාරයන් විස්තර කරයි.<br>▪ රංගාලෝකය උපකරණ භාවිතය පිළිබඳ විවිධ අත්හදා බැලීම්හි නිරත වෙයි.<br>▪ තමන්ගේ නාට්‍ය නිෂ්පාදන සඳහා රංගාලෝකය භාවිත කරයි.<br>▪ වෙනත් නාට්‍ය නිෂ්පාදන සඳහා දායක වෙයි. | ▪ රංගාලෝකය සැපයීමේ දී භාවිත කරන ප්‍රධාන පහන් හා උපකරණ<br>▪ නාට්‍යයක් සඳහා රංගාලෝකය භාවිතය<br>▪ විදුලි ආලෝක පරිපථ පිළිබඳ මූලික දැනුම | 01 |
| | | 1.3.1 නාට්‍යයක වේෂභූෂණ | ▪ වේෂභූෂණ යන්න පැහැදිලි කරයි.<br>▪ වේෂභූෂණවලින් නාට්‍යයකට ලැබෙන දායකත්වය විමසයි. | ▪ වේෂභූෂණ යන්න පැහැදිලි කිරීම.<br>▪ නාට්‍යයකට වේෂභූෂණ යොදාගැනීමේ වැදගත්කම | 01 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | ■ වේෂභූෂණ නිර්මාණයේ දී සැලකිලිමත් විය යුතු කරුණු සාකච්ඡා කරයි. | ■ ලෝකධර්මී ශෛලියට අදාළ ව වේෂභූෂණ ඇඳ දැක්වීම.<br>■ නාට්‍යධර්මී ශෛලියට අදාළ ව වේෂභූෂණ ඇඳ දැක්වීම.<br>■ වේෂභූෂණ නිර්මාණයේ දී සැලකිලිමත් විය යුතු කරුණු | |
| | | 1.5.1 නාට්‍යයක සංගීතය ගැන සොයා බලමු. | ■ නාට්‍යයක සංගීතය යෙදිය යුතු ආකාරය වටහාගනියි.<br>■ නාට්‍ය ගීතයක් ගායනා කරයි.<br>■ නාට්‍යයකට සංගීතය වැදගත් වන අයුරු ප්‍රකාශ කරයි.<br>■ නාට්‍ය ගීතවලට අනුව රංගනයෙහි යෙදෙයි. | ■ නාට්‍ය සංගීතය හඳුනාගැනීම.<br>■ නාට්‍ය සංගීතය ශෛලිය අනුව වෙනස්වන ආකාරය<br>■ නාට්‍යයේ සංගීතයෙන් ලැබෙන ප්‍රයෝජන<br>■ නාට්‍ය ගීත ගායනයේ විශේෂතා | 01 |
| | | 1.5.2 රංග රචනයේ යෙදෙමු. | ■ රංග වින්‍යාසය කුමක් ද යි විස්තර කරයි.<br>■ රංග වින්‍යාසයේ මූලික ලක්ෂණ පැහැදිලි කරයි.<br>■ නාට්‍යයකට රංග වින්‍යාසය වැදගත් වන අයුරු විස්තර කරයි. | ■ රංග වින්‍යාසය යනු කුමක් ද යි විස්තර කිරීම.<br>■ රංග වින්‍යාසය තුළ ඇති අංග ලක්ෂණ<br>■ රංග වින්‍යාසය තුළින් ගොඩනැගෙන සෞන්දර්යාත්මක බව. | 01 |
| | | 1.6.1 රංගභූමි අලංකරණ හඳුනාගනිමු. | රංගභූමි අලංකරණය යන්න විස්තර කරයි<br>■ රංගභූමි අලංකරණයෙහි විවිධතා හඳුනාගනියි.<br>■ රංගභූමි අලංකරණ නිර්මාණය කිරීමේ මූලික සිද්ධාන්ත හඳුනාගනියි.<br>■ නිර්මාණකරණය සඳහා යොදාගත හැකි අමු ද්‍රව්‍ය විස්තර කරයි. | ■ වේදිකා අලංකරණය හැඳින්වීම.<br>■ වේදිකා නාට්‍ය සඳහා අලංකරණ යොදා ගැනීමේ වැදගත්කම<br>■ වේදිකා අලංකරණ නිර්මාණයේ දී සැලකිය යුතු කරුණු | 01 |
| | | 1.7.1 බලමු, විඳිමු. | ■ ප්‍රේක්ෂකයා යනු කවරෙක් දැ යි නිර්වචනය කරගනියි. | ■ ප්‍රේක්ෂකයා යන්න හැඳින්වීම.<br>■ නාට්‍යයකට අවශ්‍ය ම අංගයක් ලෙස ප්‍රේක්ෂකයාගේ වැදගත්කම | 01 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | ■ ප්‍රේක්ෂකයා, විචාරකයකු රසිකයකු මෙන් ම විනිශ්චයකරුවකු ද වන බව ප්‍රකාශ කරයි.<br>■ ප්‍රේක්ෂක ප්‍රතිචාර නාට්‍යයක ගුණාත්මක බව මැනගැනීමට හේතු වන නිර්ණායක වන බව පවසයි.<br>■ ප්‍රේක්ෂක ප්‍රතිචාර නාට්‍යයට අවශ්‍ය ම අංගයක් බව පෙන්වාදෙයි. | ■ සාධාරණ විචාරය හා ප්‍රතිචාර නාට්‍යයක සාර්ථකත්වයට හේතු වන අයුරු | |
| | 2. ස්වකීය පරිකල්පනය මෙහෙයවා පරිසරය ආශ්‍රිත අත්දැකීම් පාදක කොටගෙන නිර්මාණකරණයෙහි යෙදෙයි. | 2.2.1 අභිරූපණ යන්නෙහි අර්ථ නිරූපණය කිරීම සහ අභිරූපණය මගින් අත්දැකීම් ඉදිරිපත් කිරීම. | ■ අභිරූපණය යන්න අර්ථ නිරූපණය කරයි.<br>■ අභිරූපණ රංගනය සඳහා භාවිත කෙරෙන ක්‍රමශිල්ප සිය රංගන සඳහා භාවිත කරයි.<br>■ අභිරූපණ ශිල්පීන් නම් කරයි. | ■ අභිරූපණ රංගය අර්ථ නිරූපණය<br>■ අභිරූපණ රංගයට අදාළ අවධානයට ගත යුතු කරුණු<br>■ අභිරූපණ රංගයේ ක්‍රමශිල්ප<br>■ අභිරූපණයේ දී ප්‍රමුඛ වන අභිනය | 01 |
| | | 2.10 කෙටි නාට්‍යයක් රචනය කර නිෂ්පාදනය කිරීම | ■ ''කෙටි නාට්‍ය සංකල්පය'' යන්න නිර්වචනය කරයි.<br>■ කෙටි නාට්‍යයෙහි සුවිශේෂතා විස්තර කරයි.<br>■ සුදුසු තේමාවන් රැස් කරයි.<br>■ කෙටි නාට්‍ය පෙළක් රචනා කරයි. | ■ කෙටි නාට්‍ය සංකල්පය පැහැදිලි කිරීම.<br>■ කෙටි නාට්‍යයෙහි සුවිශේෂතා<br>■ කෙටි නාට්‍ය පෙළ රචනය | 02 |
| | 3. නාට්‍ය හා රංග කලාවේ සිද්ධාන්ත අනුගමනය කරමින් ප්‍රායෝගික ක්‍රියාකාරකම්වල නියැළෙයි. | 3.1.1රංග අභ්‍යාසවල වැදගත්කම හඳුනාගැනීම | ■ රංග අභ්‍යාසවල නියැළෙයි.<br>■ රංග අභ්‍යාසවල යෙදීමෙන් ලැබෙන ප්‍රයෝජන සඳහන් කරයි.<br>■ රංග අභ්‍යාස වර්ග ප්‍රකාශ කරයි. | ■ රංග අභ්‍යාස යනු කුමක් ද යි අර්ථ නිරූපණය.<br>■ රංග අභ්‍යාස වර්ග<br>■ රංග අභ්‍යාසවලින් ඇති ප්‍රයෝජන<br>■ විවිධ රංග අභ්‍යාස | 02 |
| | | 3.1.3 රංග ක්‍රීඩාවල යෙදෙමු. | ■ රංග ක්‍රීඩා විශේෂ පිළිබඳ ව අදහස් ප්‍රකාශ කරයි.<br>■ රංග ක්‍රීඩාවල යෙදෙයි.<br>■ රංග ක්‍රීඩාවලින් ලබන ප්‍රයෝජන ඉදිරිපත් කරයි. | ■ රංග ක්‍රීඩාවක යෙදීම.<br>■ රංග ක්‍රීඩාවල ප්‍රයෝජන<br>■ රංග ක්‍රීඩා නිර්මාණය කිරීම.<br>■ රංග ක්‍රීඩා හඳුනාගැනීම. | 01 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | 3.3 අර්ථවත් ව සංවාද භාවිත කරමු. (සිද්ධාන්ත හා ප්‍රායෝගික) | ■ නාට්‍යයේ ගලා යාමට සංවාද භාවිතය රුකුලක් වන බව පවසයි. ■ අර්ථවත් ව සංවාද භාවිත කරයි. ■ සංවාද සඳහා උචිත හා ජීව ගුණය කැටි කර ගත් භාෂාවන් භාවිතයට පෙළඹෙයි. ■ විවිධ නාට්‍ය ශෛලීන්ට අනුරූපී ව සංවාද භාවිත කරයි. | ■ සංවාද භාවිතයේ වැදගත්කම ■ අර්ථවත් ව සංවාද භාවිත කිරීම. ■ ලෝකධර්මී ශෛලියට අදාළ ව සංවාද උච්චාරණය ■ නාට්‍යධර්මී ශෛලියට අදාළ ව සංවාද උච්චාරණය ■ වාචික අභිනය පෑමට අනුරූපී ව රූපණයෙහි යෙදීම. | 01 |
| | | 3.6 රූපණයේ දී රංග භූමිය භාවිත කළ යුතු අයුරු ප්‍රායෝගික ව අත්විඳීම. (සිද්ධාන්ත හා ප්‍රායෝගික) | ■ රංගභූමියේ ප්‍රධාන බෙදීම් පැහැදිලි කරයි. ■ රංගනයේ දී වේදිකාව භාවිත කරන අයුරු දක්වයි. ■ භූගෝලීය වශයෙන් රංගභූමිය කොටස් 09 (නවය) ලෙස දැක්වීම මනඃකල්පිත වුව ද හොඳ ප්‍රේක්ෂාවක් ලබා දීමට මෙය ඉවහල් වන ආකාරය පැහැදිලි කරයි. ■ රංගභූමියේ පසුතල නිර්මාණ තිර භාවිතය පිළිබඳව දක්වයි. | ■ රංගභූමියේ ප්‍රබල ස්ථාන ■ රංගභූමියේ කල්පිත බෙදීම් හා නිසි ලෙස ස්ථානගත වීම. ■ වේදිකාවේ සමබරතාව ■ ප්‍රේක්ෂාව ගොඩනැගීම ■ රංගභූමියේ පසුතල නිර්මාණ තිර භාවිතය | 01 |
| | 4. නාට්‍ය හා රංග කලාවට සම්බන්ධ ශ්‍රී ලාංකේය සංස්කෘතියේ ඓතිහාසික පසුබිම පැහැදිලි කරයි. | 4.1.1 ''කංකාරි රඟ ලකුණු විමසමු'' (සිද්ධාන්ත) | ■ කංකාරිය යනු කුමක්දැයි හඳුනාගනියි. ■ කංකාරියෙහි අරමුණු විමසයි. ■ කොහොඹා කංකාරියෙහි නාට්‍යමය ලක්ෂණ මතු කොට දක්වයි. ■ දේශීය සංස්කෘතික හර පද්ධති අගය කරයි. | ■ කොහොඹා කංකාරිය හා සම්බන්ධ පුරාවෘත්තය ■ කොහොඹා කංකාරියේ එන නාට්‍යමය පෙළපාලිවල දක්නට ලැබෙන නාට්‍යමය ලක්ෂණ. ■ කොහොඹා කංකාරිය ප්‍රචලිත ප්‍රදේශ. | 02 |
| | | 4.1.2 මඩු රඟ ලකුණු විමසමු (සිද්ධාන්ත ) | ■ පහන් මඩුව ශාන්තිකර්මයේ අරමුණු හා උපත් කතා විමසයි. ■ මඩු ශාන්තිකර්මය යනු කුමක් ද යි හඳුන්වයි. ■ පහන් මඩුව ශාන්තිකර්මයේ නාට්‍යමය ලක්ෂණ විමසයි. | ■ පහන් මඩුව ශාන්තිකර්මයේ උපත් කතාව ■ පහන් මඩුව ශාන්ති කර්මය පැවැත්වීමේ අරමුණු ■ පහන් මඩුව ශාන්තිකර්මයේ පෙළපාලිවල දක්නට ලැබෙන නාට්‍යමය ලක්ෂණ | 01 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | ■ දේශීය සංස්කෘතික හර පද්ධති අගය කරයි. | | |
| | | 4.2.1 සොකරි හඳුනාගනිමු (සිද්ධාන්ත) | ■ සොකරි ජන නාටකයක් ලෙස හඳුනාගනියි.<br>■ සොකරි කතාව විස්තර කරයි.<br>■ සොකරි නාට්‍යයේ විශේෂ ලක්ෂණ හඳුනාගනිමින් විස්තර කරයි.<br>■ ගැමි සංස්කෘතියේ හර පද්ධති අගයයි | ■ සොකරි නාටකයේ කතාව<br>■ සොකරි නාට්‍යයේ විශේෂ ලක්ෂණ<br>■ සොකරි නාට්‍යයේ චරිත හා අවස්ථා ප්‍රතිනිර්මාණය<br>■ සොකරි ප්‍රචලිත ව තිබූ ප්‍රදේශ<br>■ සොකරි නාට්‍යයේ පරමාර්ථ | 01 |
| | | 4.2.2 කෝලම් වගතුග විමසමු (සිද්ධාන්ත) | ■ කෝලම් යනු කුමක්දැයි හඳුන්වයි.<br>■ කෝලම් උපත් කතාව විස්තර කරයි.<br>■ කෝලම්වල විශේෂ ලක්ෂණ විමසයි.<br>■ කෝලම් රංගභූමියක රූපසටහනක් අඳියි.<br>■ කෝලම් ඉදිරිපත් කරන අනුපිළිවෙළ හඳුන්වයි.<br>■ දේශීය ජන නාටක නැරඹීමට කැමැත්ත ප්‍රකාශ කරයි. | ■ කෝලම් යනු කුමක් දැ යි හඳුනාගැනීම.<br>■ කෝලම් උපත් කතාව<br>■ කෝලම් රංග ශෛලියේ ලක්ෂණ<br>■ තානායම් පොළ හා එහි කාර්යයන්<br>■ කෝලම් රංගයක් ඉදිරිපත් කරන ආකාරය | 02 |
| | | 4.3 මොනව ද මේ නාඩගම් (සිද්ධාන්ත) | ■ නාඩගම්වල ප්‍රභවය සොයයි.<br>■ ශ්‍රී ලංකාවේ නාඩගම් ප්‍රචලිත ප්‍රදේශ නම් කරයි.<br>■ නාඩගම් රංගභූමිය හෙවත් ''කරළිය පිළිබඳව විමසයි.<br>■ නාඩගම්වල විශේෂ ලක්ෂණ හඳුන්වයි.<br>■ නාඩගමක් ඉදිරිපත් කැරෙන අනුපිළිවෙළ ප්‍රකාශ කරයි | ■ නාඩගම්වල ප්‍රභවය<br>■ නාඩගම් ප්‍රචලිත ප්‍රදේශ<br>■ නාඩගම් රංගභූමිය විස්තර කිරීම.<br>■ නාඩගම්වල විශේෂ ලක්ෂණ හා රංග ශෛලිය<br>■ පැරණි නාඩගම් හා නාඩගම්කරුවෝ | 02 |
| | | 4.4 නූර්ති හඳුනාගනිමු. (සිද්ධාන්ත ) | ■ නූර්ති නාට්‍ය සංක්‍රමණික නාට්‍ය කලාවක් ලෙස පැහැදිලි කරයි.<br>■ විශේෂිත නූර්ති නාට්‍යකරුවන් හා ඔවුන් ගේ නිර්මාණ නම් කරයි.<br>■ නූර්ති සඳහා යොදාගත් කතා වස්තූන් වර්ග කරයි. | ■ නූර්ති හඳුනාගැනීම.<br>■ නූර්ති නාට්‍යකරුවන් හා නූර්ති නාට්‍ය වර්ග<br>■ නූර්ති රංග ශෛලිය.<br>■ නූර්තියේ අන්තර්ගත නූතන නාට්‍ය ලක්ෂණ. | 02 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | ▪ නූර්ති රංග ශෛලිය හඳුනාගනියි.<br>▪ නූර්ති සංගීතය අගයයි. | | |
| | | 4.5.1 'නූතන නාට්‍ය ගමන් මග දකිමු'' (සිද්ධාන්ත) | ▪ නූතන නාට්‍යයේ ගමන් මග සකස් කිරීමට දායක වූ නාට්‍යකරුවන් විමසයි.<br>▪ කාලීන සමාජ පසුබිම අනුව විවිධ නාට්‍ය ප්‍රවණතා ඇති වූ බව ප්‍රකාශ කරයි.<br>▪ නූතන නාට්‍ය ප්‍රවණතා හඳුන්වයි.<br>▪ ඒ ඒ යුගයට අදාළ නාට්‍ය නිර්මාණ නම් කරයි | ▪ ඊ.එෆ්.සී. ලුඩොවයික් ගේ ඉංග්‍රීසි නාට්‍ය හැඳින්වීම.<br>▪ නූතන නාට්‍යයේ ගමන්මග සකස් කිරීමට දායක වූ නාට්‍යකරුවන්<br>▪ අතීතයේ සිට කාලීන සමාජ පසුබිම අනුව ඇති වූ විවිධ නාට්‍ය ප්‍රවණතා<br>▪ විවිධ යුගයන් අනුව බිහි වූ නාට්‍ය නිර්මාණ | 02 |
| | | 4.5.2 නාට්‍ය වර්ග හඳුනාගැනීම. (සිද්ධාන්ත ) | ▪ පරිවර්තන, අනුවර්තන හා ස්වතන්ත්‍ර නාට්‍ය යනු කුමක් ද යි හඳුන්වයි.<br>▪ පරිවර්තන, අනුවර්තන හා ස්වතන්ත්‍ර නාට්‍ය නම් කරයි.<br>▪ එම නාට්‍යවල විශේෂතා විමසයි. | ▪ පරිවර්තන, අනුවර්තන හා ස්වතන්ත්‍ර නාට්‍ය හඳුනාගැනීම.<br>▪ පරිවර්තන හා අනුවර්තන නාට්‍යවල මුල් කෘති හා මුල් රචකයෝ<br>▪ එම කෘතිවල පරිවර්තකයන් හා පරිවර්තිත කෘති<br>▪ ස්වතන්ත්‍ර නාට්‍ය හා නාට්‍යකරුවන්<br>▪ අනුවර්තන, පරිවර්තන හා ස්වතන්ත්‍ර නාට්‍ය එකිනෙකට වෙනස් වන ආකාරය. | 01 |
| | | 4.6 නාට්‍යකරුවන් හඳුනාගනිමු. (සිද්ධාන්ත ) | ▪ ජයලත් මනෝරත්න, ආර්.ආර්. සමරකෝන් සහ ගාමිණී හත්තොටුවේගම යන නාට්‍යකරුවන් හඳුනාගනියි.<br>▪ එම නාට්‍යකරුවන් විවිධ කලා අංශයන්හි දක්වන ප්‍රවීණත්වය විමසයි.<br>▪ ඔවුන්ගේ නාට්‍ය නිර්මාණ නම් කරයි.<br>▪ ඔවුන්ගේ නාට්‍ය දෘෂ්ටිය පිළිබඳ ව ප්‍රකාශ කරයි.<br>▪ ඔවුන් විසින් නාට්‍ය කලාව අරභයා කරන ලද සේවය පසසයි. | ▪ පාඩමේ දී විස්තර කෙරුණු නාට්‍යකරුවන් හඳුනාගැනීම.<br>▪ ඔවුන්ගේ නාට්‍ය දෘෂ්ටීන්<br>▪ දේශීය නාට්‍ය කලාවේ ප්‍රගමනයට මෙම නාට්‍යවේදීන්ගෙන් ලැබුණු දායකත්වය<br>▪ මෙම නාට්‍යකරුවන්ගේ නිර්මාණ<br>▪ මෙම නාට්‍යකරුවන් විවිධ කලා ක්ෂේත්‍රවල දැක්වූ දායකත්වය. | 01 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | 4.7 ''රංගන ශිල්පීන් හඳුනාගනිමු''. (සිද්ධාන්ත ) | ■ ඡායාරූප ඇසුරින් චාන්දනී සෙනෙවිරත්න, මැණිකේ අත්තනායක, නීල් අලස් යන රංගන රංගන ශිල්පීන් හඳුනාගනියි.<br>■ ඔවුන්ගේ රංගන කුශලතා අගයයි.<br>■ ඔවුන් රඟපෑ නාට්‍ය නම් කරයි.<br>■ චිත්‍රපට සහ රූපවාහිනී මාධ්‍යන්හි ඔවුන්ගේ රංගන දායකත්වය සාකච්ඡා කරයි. | ■ චාන්දනී සෙනෙවිරත්න, මැණිකේ අත්තනායක, නීල් අලස් යන රංගන ශිලපීන් හඳුනාගැනීම.<br>■ ඔවුන්ගේ රංගන කුශලතා සාකච්ඡා කිරීම.<br>■ ඔවුන් රඟ පෑ නාට්‍ය<br>■ ඔවුන් ගේ රංගනයෙහි සුවිශේෂ | 01 |
| | 5. නාට්‍යමය අවස්ථා සෞන්දර්යාත්මක ව විඳගැනීම හා මානවහිතවාදියකු ලෙස සමාජගතවීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි. | 5.1.1/5.2.1/5.2.2 විකෘති නාට්‍යය අධ්‍යයනය කිරීම. (සිද්ධාන්ත ) | ■ යෞවන නාට්‍ය සංකල්පය හඳුන්වයි.<br>■ විකෘති නාට්‍ය නිර්මාණය කිරීමට බලපෑ සමාජ පසුබිම හඳුනාගනියි.<br>■ නාට්‍ය තේමාව සහ දෘෂ්ටිය වටහා ගනියි.<br>■ චරිත හා අවස්ථා මගින් නාට්‍යයේ ගැටුම් කුළුගන්වන අයුරු විමසයි.<br>■ විකෘති නාට්‍යයෙන් ප්‍රකාශිත තේමාව පැහැදිලි කරයි.<br>■ නාට්‍ය රචනයේ ප්‍රබලතා සහ දුබලතා දක්වයි.<br>■ නාට්‍යයේ රංග ශෛලියේ ස්වභාවය පැහැදිලි කරයි.<br>■ භාෂා භාවිතය හා රංගෝචිත බව විස්තර කරයි. | ■ යෞවන නාට්‍ය යනු කුමක් දැ යි විස්තර කිරීම.<br>■ විකෘති නාට්‍යයේ ප්‍රධාන තේමාව, අතුරු තේමාවන් සහ දෘෂ්ටිය<br>■ චරිත නිරූපණයේ ස්වභාවය<br>■ විකෘති නාට්‍ය නූතන සමාජය හා සංසන්දනය<br>■ විකෘති නාට්‍ය නිර්මාණය කිරීමට බලපෑ සමාජ පසුබිම | 03 |